**ශීර්ෂය 326 - ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව**
**------------------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**
---------------

**1.1. මතය**
--------

ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවේ 2021දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 මැයි 19 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 ජුනි 01 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

2021 දෙසැම්බර් 31 දිනට ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2. මතය සඳහා පදනම**
----------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3. මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**
-----------------------------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4. මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1. වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මූලධන වැය විෂයයන් 04 ක් සඳහා සලසා ගෙන තිබූ රු.15,700,000 ක ඇස්තමේන්තු ප්‍රතිපාදනවලින් සියයට 44 කට වැඩියෙන් එනම් රු.6,954,661 ක ප්‍රතිපාදන ඉතිරිව තිබූ අතර එම එක් එක් වැය විෂයයන් හි ඉතිරිවීම් සියයට 11 සිට සියයට 100 ක් දක්වා වූ පරාසයක පැවතුණි. | ඇස්තමේන්තුවලට වඩා වියදම් අඩුවීම හා වියදම් සීමා කිරීම හේතුවෙන් මෙම ප්‍රතිපාදන ප්‍රමාණය ඉතිරිවිය. | වාර්ෂික ඇස්තමේන්තු පිළියෙල කිරීමේ දී මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

### 2.2 ගණන්දීමේ නිලධාරී විසින් සිදුකළ යුතු සහතික වීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළයුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීතාවය පිළිබඳව කලින් කළ සමාලෝචනය සිදුකර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදුකර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදුකළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය පාලනය සඳහා ක්‍රමවත් අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර ඇති අතර ඒ සම්බන්ධයෙන් ප්‍රගති සමාලෝචන කමිටු රැස්වීම් පවත්වා නොමැති අතර එබැවින් මෙම පද්ධතියේ සඵලදායීතාවය පිළිබඳව සමාලෝචනය කිරීම අසීරු කාර්යයක් වී ඇත. එමනිසා සමාලෝචන වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට නොහැකි වූ ඇති අතර ඉදිරියේදී එසේ ඉදිරිපත් කිරීමට කටයුතු සිදු කරන බව දන්වා සිටිමි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2.3 නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | නිරීක්ෂණය<br>වටිනාකම (රු) | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 371 (2) | 113,355 | ලබා ගත් අත්තිකාරම් මුදලක් කාර්යය නිම කළ විගසම පියවිය යුතු වුවද විවිධ කාර්යයන් සඳහා අවස්ථා 05 කදි ලබා දී තිබූ අත්තිකාරම් මුදල් පියවිය යුතු දිනයේ සිට දින 14 - 164 අතර කාලයක් ප්‍රමාද කර පියවා තිබුණි. | දුම්රිය හා තැපැල් මගින් ලිපිද්‍රව්‍ය ප්‍රවාහනය සඳහා ලබාගන්නා අත්තිකාරම් මුදල් ප්‍රාදේශිය කාර්යාල මගින් පියවීමේ දී ප්‍රමාදයන් හේතුවෙන් හා වවුචර් සංවර්ධන අංශයේ සිට ගිණුම් අංශයට ප්‍රමාදවී ලැබීම හේතුවෙන් අත්තිකාරම් පියවීම ප්‍රමාද වී ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම |
| (ආ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 හා 2018 ජනවාරි 24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ | | | | |
| (i.) 1 ඡේදය | - | ආයතනයේ සේවයේ නියුතු සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර නොතිබුණි. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 හි ඇමුණුම් අංක 01 ආකෘතිය අනුව මෙම දෙපාර්තමේන්තුවේ සමස්ථ කාර්ය මණ්ඩලය සඳහා වාර්ෂික කාර්යසාධන ගිවිසුම් මේ වන විට සකස් කර නොමැති අතර, වාර්ෂික කාර්යසාධන ගිවිසුම් සකස් කිරීමේ මූලික කටයුතු මේ වන විට | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | | සිදුකරමින් පවතින බව දන්වා සිටිමි. | |
| (ii.) 4 ඡේදය | - | රාජ්‍ය සේවය තුළ කේන්ද්‍ර වී පවත්නා මානව සම්පත රටේ සංවර්ධනය සඳහා වඩාත් කාර්යක්ෂමව හා සඵලදායී ලෙස යොදා ගැනීම පිණිස රාජ්‍ය අංශය සතු මානව සම්පත සැලසුම්සහගතව සංවර්ධනය කිරීම අනිවාර්යය අවශ්‍යතාවයකි. ආයතනයේ කාර්යමණ්ඩලයේ සියලු දෙනාටම පවත්නා හා පැවැත්විය යුතු නිපුණතා අතර පරතරය පියවීම සඳහා සකස් කළ යුතු මානව සම්පත් සංවර්ධන සැලැස්ම සකස් කර නොතිබුණි. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 හි 6.5 ඡේදය අනුව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකිම පැවරීම සඳහා ජ්‍යෙෂ්ඨ ප්‍රජා විශෝධන නිලධාරියෙකු පත් කිරීමට අවශ්‍ය කටයුතු මේ වන විට සිදුකරමින් පවතින බව දන්වා සිටිමි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) අංක 05/2008 හා 2008 පෙබරවාරි 06 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | - | පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තියක් හඳුන්වා දීමට කටයුතු කර නොතිබුණි. | 1999 අංක 46 දරන ප්‍රජා පාදක විශෝධන පනත ගරු අධිකරණයන්හී ක්‍රියාත්මක වීමේ දී මහජනතාව සමඟ සෘජුවම සම්බන්ධ නොවන අතර, මහජනතාවට තොරතුරු විවෘතව සැපයීමට නොහැකි අවස්ථාද ඇත. විශේෂයෙන්ම ප්‍රදාන කාර්යාලවල මහජනතාව සමඟ සෘජුවම සම්බන්ධ නොවේ. නමුත් පුරවැසි සේවා ලාභී ප්‍රඥප්ති සංකල්පය දෙපාර්තමේන්තුව තුළ ස්ථාපිත කිරීමේ | චක්රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| | | අවශ්‍යතාවය පිළිගනිමින් දෙපාර්තමේන්තුවට ගැලපෙන සහ සුදුසු පුරවැසි සේවාලාභී ප්‍රඥප්තියක් ඉදිරියේ දී සකස් කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1. කාර්යය සාධනය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙහි ප්‍රධාන ක්‍රියාකාරකම් 10 ක් හඳුනාගෙන පැවති අතර එයින් කාර්යයන් 08 ක ප්‍රමාණවත් කාර්ය සාධනයක් ලඟාකරගෙන නොතිබුණි. එසේම ප්‍රධාන කාර්යය වූ අධිකරණ මඟින් ආඥාලාභීන් සඳහා ප්‍රජා විශෝධන නියෝග ලබා ගැනීම වෙනුවෙන් වසර තුළ දි ආඥාලාභීන් 20,000 ක් සඳහා නියෝග ලබාගැනීමට සැලසුම් කළද සත්‍ය වශයෙන් ආඥාලාභීන් 4,674 ක් සඳහා පමණක් ප්‍රජා විශෝධන නියෝග ලබා ගෙන තිබුණි. | ➢ කොවිඩ් වසංගත තත්ත්වය යටතේ පනවන ලද සෞඛ්‍ය නීති රෙගුලාසි තුළ අධිකරණය විසින් අධිකරණ කටයුතු සීමා කිරීම හා ප්‍රජා විශෝධන නියෝග ලබා දීම සීමා කිරීම නිසා එම ඉලක්කය සපුරා ගැනීම සීමා විය.<br>➢ ස්වයං රැකියා ව්‍යාපෘති කිරීමට අවශ්‍ය ණය පහසුම් ලබා ගැනීමට බැංකුවල සහය අවශ්‍ය වන අතර, ආඥාලාභීන් සඳහා ණය ලබාදීම පිළිබඳව බැංකු වෙතින් මේ වන විට ධනාත්මක ප්‍රතිචාර ලැබී නොමැති වීම. | ක්‍රියාකාරී සැලැස්මේ සැලසුම් කරන ලද ක්‍රියාකාරකම්වල ප්‍රමාණවත් ප්‍රගතියක් ලඟාකර ගත හැකි පරිදි දෙපාර්තමේන්තුව කටයුතු කළ යුතුය. |

**3.2. ප්‍රසම්පාදනයන්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2006 4(2) වගන්තිය ප්‍රකාරව අවම වශයෙන් වසර 03 ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු සම්බන්ධයෙන් ප්‍රසම්පාදන සැලැස්ම සකස් කළ යුතු අතර එම වගන්තියේ 2006 4(2) හි දැක්වෙන පරිදි ප්‍රසම්පාදන කටයුතු ආරම්භවීමේ අවස්ථාවේ සිට අවසන් කරන තුරු, එක් එක් ප්‍රසම්පාදන ක්‍රියාවන් හි පියවර දැක්වෙන පරිදි විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කල යුතු වුවද 2021 වර්ෂය සඳහා පමණක් ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර තිබුණි. | එක් එක් ප්‍රසම්පාදන ක්‍රියාවන් හි පියවර දැක්වෙන පරිදි විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් මේ වන විට සකස් කර නොමැති අතර ඉදිරි වර්ෂයේ සිට එම සැලැස්ම සකස් කිරීමට කටයුතු කරමි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2006 4(2) වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

**4. යහපාලනය**

**4.1. අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(1) වගන්තිය අනුව දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන කටයුතු සිදුකිරීම පිණිස අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොතිබුණි. | අභ්‍යන්තර විගණන තනතුරක් මේ වන විට අනුමත කර ඇති නමුත් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය විසින් මේ දක්වා අභ්‍යන්තර විගණන තනතුර සඳහා නිලධාරියෙකු අනුයුක්ත කර නැත. | 2018 අංක 18 දරන ජාතික විගණන පනතේ 40(1) වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**5.** **මානව සම්පත් කළමනාකරණය**

---------------------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය තුළ දී දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 03 ක් ද තෘතියික මට්ටමේ පුරප්පාඩු 19 ක් ද ද්විතීයික මට්ටමේ පුරප්පාඩු 12 ක්ද හා ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 06 ක්ද වශයෙන් පුරප්පාඩු 40 ක් පැවතුණි. | ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු අතුරින් අභ්‍යන්තර විගණක 01 සහ ශ්‍රී.ලං.ප.සේ. 01 තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත දන්වා ඇත. දෙපාර්තමේන්තු ගත තනතුරු සඳහා අවශ්‍ය සුදුසුකම් ලත් නිලධාරීන් මේ වන විට දෙපාර්තමේන්තුව තුළ නොමැත.<br><br>තෘතියික මට්ටමේ පුරප්පාඩු අතරින් ජ්‍යෙෂ්ඨ ප්‍රජා විශෝධන නිලධාරි තනතුරු 10 සඳහා නිලධාරීන් බඳවා ගැනීමට අදාළ සම්මුඛ පරීක්ෂණ පවත්වා අවසන් කර ඇති අතර ප්‍රජා විශෝධන නිලධාරීන් බඳවා ගැනීම සඳහා සුදුසුකම් සහිත අයදුම්පත් ලැබී නොමැත. පරිපාලන නිලධාරී, භාෂා පරිවර්තක හා ද්විතීයික මට්ටමේ තනතුරු 12 සහ ප්‍රාථමික මට්ටමේ තනතුරු 06ක පුරප්පාඩු පිරවීම සඳහා මාර්ගගත ක්‍රමය ඔස්සේ ඉල්ලුම් කර ඇත. | සුදුසු නිලධාරීන් පුරප්පාඩු සඳහා බඳවාගෙන ඵලදායී සේවා මට්ටමක් පවත්වා ගැනීමට කටයුතු කළ යුතු වීම. |